## මුදල් සහ බැංකු කටයුතු

### මුදල් සැපයුම

පසුගිය වර්ෂය හා සැසඳීමේදී, 1984 වර්ෂය තුළ මූල්‍ය අංශයේ කැපී පෙනෙන ලක්ෂණය වූයේ මුදල් හා ණය සමස්තයන්හි වර්ධන වේගය තියුණු ලෙස අඩුවීමයි. මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් සහ ඉල්ලුම් තැන්පතු වලින් සමන්විත වන පටු මුදල් සැපයුම ($M_1$), 1983 වර්ෂයේදී වූ රුපියල් 298 කෝටි 80 ලක්ෂය (සියයට 25 ) ක ඉතා ඉහළ වර්ධනය සමග සසඳන විට, වර්ෂය තුළදී රුපියල් 207 කෝටි 60 ලක්ෂය (සියයට 14) කින් වැඩි විය. වාණිජ බැංකු වෙතැති පෞද්ගලික අංශයේ කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු වලින් සමන්විත වන ආසන්න මුදල්, 1983 වර්ෂයේදී වූ රුපියල් 375 කෝටි 90 ලක්ෂය (සියයට 20) ක වැඩිවීම සමග සසඳන විට 1984 වර්ෂයේදී රුපියල් 409 කෝටි 50 ලක්ෂය (සියයට 18) කින් වැඩි විය. මේ අනුව ($M_1$) සහ ආසන්න මුදල් එකතුවෙන් සමන්විත වන පුළුල් මුදල් සැපයුම ($M_2$), පසුගිය වර්ෂයේදී වූ රුපියල් 674 කෝටි 70 ලක්ෂය (සියයට 22) ක වැඩිවීම සමග සසඳන විට වර්ෂය තුළදී රුපියල් 617 කෝටි 10 ලක්ෂය (සියයට 17) කින් වැඩිවී රුපියල් 4,342 කෝටි 70 ලක්ෂයක් විය.


1984 වර්ෂය තුළ දී මුදල් සැපයුමේ ඇතිවූ ප්‍රසාරණය, බැංකු විදේශීය වත්කම් (ශුද්ධ) නොකඩවා වර්ධනයවීමේ සහ දේශීය ණය වර්ධනය අඩු වීමේත් ප්‍රතිඵලයකි. දේශීය ණය ප්‍රසාරණ අනුපාතිකය අඩු වීමට හේතු වූ ඉතාමත් වැදගත් සාධකය වූයේ රජයට දෙන ලද ශුද්ධ ණය තියුණු ලෙස අඩුවීමයි. මේ අතර, මහ බැංකුව විසින් අත්‍යාවශ්‍ය නොවන අත්තිකාරම් මත ණය සීමාවන් පැනවීම හේතුවෙන් පෞද්ගලික අංශයට දෙන ලද ණය (දළ) වර්ධනයද අඩු විය.

මූල්‍ය සමස්තයන්ගේ සංයුතියෙහි විස්තරාත්මක විශ්ලේෂණය මගින් දැක්වෙන පරිදි වර්ෂය තුළ $M_1$ හි මධ්‍යස්ථ වර්ධනය සඳහා හේතු වූ ප්‍රධාන සාධකය වූයේ පසුගිය වර්ෂය හා සසඳන විට ඉල්ලුම් තැන්පතු වල සිදුවූ සැළකිය යුතු අඩු වර්ධනයයි. මුදල් සැපයුමෙහි ඉල්ලුම් තැන්පතු කොටස, 1983 වර්ෂයේදී වූ සියයට 31 ක වර්ධනය හා සැසඳීමේ දී 1984 දී සියයට 10 කින් වර්ධනය විය. මේ අනුව $M_1$ හි ඉල්ලුම් තැන්පතු කොටස, 1983 දී වූ සියයට 51 සිට 1984 දී සියයට 49 දක්වා පහත වැටුණි. මේ අතර, මහජනයා වෙතැති ව්‍යවහාර මුදල්, 1983 දී වූ සියයට 20 ක වර්ධනය සමග සසඳන විට 1984 දී සියයට 19 කින් වැඩි විය. පසුගිය වර්ෂයේදී මෙන්ම උත්සව කාලයන් සඳහා මුදලට ඇති ඉහළ ඉල්ලුම පිළිබිඹු කරමින්, ව්‍යවහාර මුදල් දැරීම්හි ඉතා ඉහළ මාසික වැඩිවීම් මාර්තු (සියයට 8) සහ දෙසැම්බර් (සියයට 5) මාසයන්හි දක්නට ලැබුණි.

ආසන්න මුදල් වර්ධනය වැඩි වශයෙන්ම රාජ්‍ය සංස්ථාවල කාලීන සහ ඉතිරි කිරීමේ තැන්පතු වැඩිවීම නිසා සිදුවූ අතර, එය පසුගිය වර්ෂයේදී වූ රුපියල් 17 කෝටි 70 ලක්ෂයක හෙවත් සියයට 4 ක අඩුවීම සමග සසඳන විට, 1984 දී රුපියල් 142 කෝටි 80 ලක්ෂයකින් හෙවත් සියයට 35 කින් වැඩි විය. පෞද්ගලික අංශයේ අනෙකුත් ගණුදෙනු කරුවන්ගේ කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු 1983 වර්ෂයේදී වූ සියයට 27 ක වැඩි වීම සමග සසඳන විට 1984 දී සියයට 15 කින් වැඩි විය. පෞද්ගලික අංශයේ අනෙකුත් ගණුදෙනු කරුවන්ගේ තැන්පතු ප්‍රසාරණය අඩුවීමට තරමක් දුරට හේතු වූයේ වාණිජ බැංකු විසින් තැන්පතු පොළී අනුපාතික විශාල වශයෙන් අඩු කිරීමේ හේතුවෙන්, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ මූල්‍ය සමාගම් වැනි අනෙකුත් තැන්පතු රාශීකරණ ආයතනවලට වාණිජ බැංකු වලින් තැන්පතු ගලා යාමයි. වාණිජ බැංකු වෙතැති සමූපකාර ආයතනවල තැන්පතු වර්ධනය ද 1983 දී වූ සියයට 31 සිට 1984 දී සියයට 12 දක්වා අඩු විය.

## මුදල් සැපයුම

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

1984 දී මුදල් සැපයුමේ වර්ධනයට දායක වූ වඩාත්ම සැළකිය යුතු සාධකය වූයේ ප්‍රධාන වශයෙන් තේ අපනයන ඉපයීම් පුළුල් වීම හේතුකොටගෙන සැළකිය යුතු ලෙස වැඩි වූ බැංකු සතු (ශුද්ධ) විදේශීය වත්කම් ය. බැංකු සතු විදේශීය වත්කම් (ශුද්ධ) 1983 දී වූ රුපියල් 81 කෝටි 50 ලක්ෂයක සාමාන්‍ය වර්ධනය සමග සසඳන විට 1984 දී රුපියල් 677 කෝටි 70 ලක්ෂයකින් කැපී පෙනෙන ලෙස වැඩි විය. පසුගිය වර්ෂයට වඩා සැළකිය යුතු ලෙස දේශීය ණය ප්‍රසාරණය අඩුවීම, 1984 වර්ෂයේ මුල්‍ය ප්‍රසාරණය අඩුවීමට හේතු වූ ප්‍රධාන සාධකය විය. 1983 දී වූ රුපියල් 689 කෝටි 50 ලක්ෂය (සියයට 16)ක වර්ධනය සමග සැසඳීමේදී දේශීය ණය, 1984 දී රුපියල් 63 කෝටි 30 ලක්ෂය (සියයට 1) කින් වැඩි විය. මුදල් සැපයුම මත සංකෝචනාත්මක බලපෑමක් ඇති කරමින් බැංකු ක්‍රමයෙහි අනෙකුත් ශීර්ෂයන් (ශුද්ධ), 1983 වර්ෂයේදී වූ රුපියල් 96 කෝටි 40 ලක්ෂයක වර්ධනයක් සමඟ සසඳන විට, 1984 දී රුපියල් 124 කෝටියකින් වැඩි විය. වර්ෂය තුළදී අනෙකුත් ශීර්ෂයන්හි (ශුද්ධ) වැඩිවීම 1984 ජූනි මාසයේ සිට මහ බැංකු සුරකුම්පත් නිකුත් කිරීම හේතුවෙන් මහ බැංකුවේ අනෙකුත් වගකීම් වර්ධනය වීම මගින් සැළකිය යුතු ලෙස පිළිබිඹු විය.

වසර පුරාම බැංකු විදේශීය වත්කම් වර්ධනය වීමෙහි ප්‍රතිඵලය වූයේ ගෙවුම් ශේෂ තත්ත්වය සැළකිය යුතු ලෙස වැඩි දියුණු වීමයි. මහ බැංකුව සතු පිට රට වල ඇති මුදල් සහ ශේෂ දැරීම් රුපියල් 383 කෝටි 90 ලක්ෂයකින් වැඩි වූ අතර, විදේශීය රාජ්‍ය සුරකුම්පත්හි සහ භාණ්ඩාගාර බිල්පත්හි ආයෝජන රුපියල් 149 කෝටි 30 ලක්ෂයකින් වැඩි විය. පිටරටවල ඇති මුදල් සහ ශේෂ දැරීම් හි වැඩි වීම, අපනයන ඉපයීම් පුළුල්වීම හේතුවෙන් වාණිජ බැංකු වලින් මහ බැංකුව විදේශීය විනිමය මිළදී ගැනීම් ඉහළ යාම තුළින් පිළිබිඹු විය.

දේශීය ණය ප්‍රසාරණයෙහි වූ කැපී පෙනෙන අඩු වීම, පෞද්ගලික අංශයට දෙන ලද ණය (දළ) වර්ධනය මගින් ඇති වූ ප්‍රසාරණාත්මක බලපෑම මුළුමනින්ම වාගේ සමහන් කළ, රජයට දෙන ලද ශුද්ධ ණය ප්‍රමාණය පහත වැටීම නිසා සිදු විය. 1983 දී වූ රුපියල් 38 කෝටි 30 ලක්ෂයක හෙවත් සියයට 2 ක වර්ධනය සමග සසඳන කල රජයට දෙන ලද ශුද්ධ ණය 1984 දී රුපියල් 297 කෝටි 90 ලක්ෂයකින් හෙවත් සියයට 17 කින් පහත වැටුණි. රජය බැංකු ක්‍රමය මත වූ අඩු රඳා පැවැත්ම පෙන්වමින්, මුළු දේශීය ණය වලින් රජයට දෙන ලද ශුද්ධ ණය 1983 දී වූ සියයට 36 ක ප්‍රමාණයක සිට 1984 දී සියයට 29 දක්වා අඩු විය. රජයට දෙන ලද ශුද්ධ ණය අඩුවීම, රජයට දෙන ලද ණය (දළ) රුපියල් 280 කෝටි 80 ලක්ෂයකින් හෙවත් සියයට 13 කින් අඩුවීමේ සහ රජයේ තැන්පතු සහ මුදල් ශේෂ රුපියල් 17 කෝටි 10 ලක්ෂයකින් හෙවත් සියයට 5 කින් වැඩිවීමේ ශුද්ධ ප්‍රතිඵලය විය. 1983 දී වූ රුපියල් 139 කෝටි 30 ලක්ෂය (සියයට 8) ක වර්ධනය සමග සසඳන විට, මහ බැංකුව වෙතින් රජයේ ණය ගැනීම් 1984 දී රුපියල් 414 කෝටි 40 ලක්ෂය (සියයට 21) කින් සැළකිය යුතු ලෙස පහත වැටුණි. මෙය, රජයේ සහ රජය සහතික කළ සුරකුම්පත් දැරීම් රුපියල් 539 කෝටි 30 ලක්ෂයකින් අඩුවීමේ සහ තාවකාලික අත්තිකාරම් රුපියල් 124 කෝටි 90 ලක්ෂයකින් වැඩි වීමේ ශුද්ධ ප්‍රතිඵලය විය. මේ අතර වාණිජ බැංකු විසින් රජයට දෙන ලද ණය (දළ) 1983 දී වූ රුපියල් 14 කෝටිය (සියයට 8 ) ක අඩුවීමත් සමග සසඳන විට, 1984 දී රුපියල් 133 කෝටි 60 ලක්ෂය (සියයට 85) කින් වැඩිවි ය. වාණිජ බැංකුවල අතිරික්ත අරමුදල් ද්විතීයික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ පොළට ඇදීයාම පෙන්නුම් කරමින්, වාණිජ බැංකු වලින් රජය ගත් ණය ප්‍රධාන වශයෙන් පිළිබිඹු වූයේ එම වෙළෙඳ පොළෙහි රුපියල් 140 කෝටි 40 ලක්ෂයක භාණ්ඩාගාර බිල්පත් දැරීම් තුළිනි.

රජය, බැංකු ක්‍රමය මත රඳා සිටීම අඩු කිරීමට සාධක කිහිපයක් උපකාරී විය. පළමුව, වර්ෂය තුළදී රජයේ ආදායම් සියයට 50 කින් වැඩි වීම, රජයේ සම්පත් ප්‍රමාණය ඉහළ නැංවීමට හේතු විය. දෙවනුව, 1984 පෙබරවාරි මාසයේදී මහ බැංකුවේ ලාභ වලින් රුපියල් 165 කෝටි-යක ප්‍රමාණයක් රජයට පැවරීම නිසා එමගින් මහ බැංකුවට එතෙක් නොපියවා පැවති වගකීම්

## 1 . 45 සංඛ්‍යා සටහන


## මුල්‍ය සමස්තයන් 1982 – 1984

(ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ)

| කාලච්ඡේදය අවසානයේදී | පටු මුදල් සැපයුම ($M_1$) | | | | | | පුළුල් මුදල් සැපයුම ($M_2$) | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1982 | 1983 | 1984 | වෙනස % 1981/1982 | වෙනස % 1982/1983 | වෙනස % 1983/1984 | 1982 | 1983 | 1984 | වෙනස % 1981/1982 | වෙනස % 1982/1983 | වෙනස % 1983/1984 |
| ජනවාරි .. | 11,046 | 11,852 | 14,964 | + 20·0 | + 7·3 | + 26·3 | 26,890 | 30,802 | 38,277 | + 31·0 | + 14·5 | + 24·3 |
| පෙබරවාරි .. | 11,178 | 12,234 | 14,939 | + 20·4 | + 9·4 | + 22·1 | 26,758 | 31,708 | 39,031 | + 32·5 | + 18·5 | + 23·1 |
| මාර්තු .. | 11,671 | 12,986 | 15,439 | + 15·3 | + 11·2 | + 18·9 | 28,240 | 32,874 | 39,762 | + 28·5 | + 16·4 | + 21·0 |
| අප්‍රේල් .. | 11,276 | 12,842 | 15,317 | + 17·8 | + 13·9 | + 19·3 | 28,395 | 33,114 | 39,629 | + 31·8 | + 16·6 | + 19·7 |
| මැයි .. | 11,132 | 12,606 | 14,331 | + 21·5 | + 13·2 | + 13·7 | 29,128 | 32,491 | 39,133 | + 35·9 | + 11·5 | + 20·4 |
| ජූනි .. | 10,815 | 12,589 | 14,768 | + 19·8 | + 16·4 | + 17·3 | 28,739 | 32,798 | 39,690 | + 32·6 | + 14.1 | + 21·0 |
| ජූලි .. | 10,710 | 12,964 | 14,901 | + 17·8 | + 21·4 | + 14·9 | 28,459 | 33,846 | 39,642 | + 29·0 | + 18·9 | + 17·1 |
| අගෝස්තු .. | 10,892 | 12,977 | 14,811 | + 18·5 | + 19·1 | + 14·1 | 28,494 | 33,732 | 39,767 | + 28·6 | + 18·4 | + 17·9 |
| සැප්තැම්බර් .. | 11,171 | 13,322 | 15,549 | + 18·3 | + 19·3 | + 16·7 | 29,781 | 34,620 | 40,808 | + 27·0 | + 16·2 | + 17·9 |
| ඔක්තෝබර් .. | 11,413 | 13,572 | 16,041 | + 19·9 | + 18·9 | + 18·2 | 30,161 | 35,314 | 41,586 | + 26·6 | + 17·0 | + 17·8 |
| නොවැම්බර් .. | 11,452 | 13,544 | 15,678 | + 21·1 | + 18·3 | + 15·8 | 29,860 | 35,324 | 42,007 | + 25·3 | + 18·3 | + 18·9 |
| දෙසැම්බර් .. | 11,760 | 14,748 | 16,824 | + 17·4 | + 25·4 | + 14·1 | 30,510 | 37,257 | 43,427 | + 24.9 | + 22·1 | + 16·6 |
| මාසික සාමාන්‍යය .. | 11.210 | 13.020 | 15.297 | + 18·9 | + 16·1 | + 17·5 | 28.785 | 33.657 | 40.230 | + 29·3 | + 16·9 | + 19·5 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

## දේශීය ණය
මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.


වලින් සමහරක් පියවා ගැනීමට හැකි විය. තෙවනුව, විදේශීය ආධාර වැඩිවීම තව දුරටත් රජයේ සම්පත් පුළුල් කළේය. සිව්වෙනිව, බැංකු නොවන මූලාශ්‍ර, රුපියල් සුරැකුම්පත් වල වැඩියෙන් දායක වීම නිසා රජයට බැංකු ක්‍රමය මත අඩුවෙන් රඳා පැවතීමට හැකි විය.

1983 දී වූ රුපියල් 651 කෝටි 20 ලක්ෂයක හෙවත් සියයට 26 ක ඉතා ඉහළ වර්ධනය සමග සසඳන විට, පෞද්ගලික අංශයට දෙන ලද දළ ණය 1984 දී රුපියල් 361 කෝටි 20 ලක්ෂයකින් හෙවත් සියයට 11 කින් වැඩි විය. පෞද්ගලික අංශයට දෙන ලද දළ ණයෙහි වැඩිවීම අඩු වේගයකින් සිදුවූයේ, ප්‍රමුඛ නොවන අංශ සඳහා ණය දීමේදී සීමා කිරීම් ඇතිකරමින් 1984 මාර්තු සහ මැයි මාසයන්හිදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලද වරණාත්මක ණය පාලන ක්‍රම හේතුවෙනි. එපමණක් නොව, අපනයන අංශයෙහි ආදායම වැඩිවෙමින් පැවතීම, ආයෝජන අරමුදල් ඉල්ලුමෙහි අඩුවීමට හේතු විය. 1983 දී වූ රුපියල් 617 කෝටිය (සියයට 32) ක වර්ධනය සමග සසඳන විට, පෞද්ගලික අංශයේ අනෙකුත් ගණුදෙනුකරුවන්ගේ බැංකු ණය 1984 දී රුපියල් 410 කෝටි 40 ලක්ෂය (සියයට 16) කින් වැඩි විය. පෞද්ගලික අංශයේ අනෙකුත් ගණුදෙනුකරුවන්ට දෙන ලද ණයෙහි වැඩිවීම, ණය (රුපියල් 286 කෝටි 10 ලක්ෂය), අයිරාවන් (රුපියල් 98 කෝටි 80 ලක්ෂය) සහ ආනයන බිල්පත් (රුපියල් 11 කෝටි 60 ලක්ෂය) වැඩිවීමේ ස්වරූපය ගනු ලැබිය. ආනයන සහ පරිභෝජන අංශයන් සඳහා දුන් බැංකු ණයෙහි අඩුවීමක් වාර්තා වූ අතර, අපනයන, සිල්ලර සහ තොග වෙළෙඳාම, වෙළෙඳ සහ කර්මාන්ත ණය වර්ෂය තුළදී වැඩි විය. පසුගිය වර්ෂයේදී වූ රුපියල් 63 කෝටි 50 ලක්ෂය (සියයට 54) ක සැළකිය යුතු වර්ධනය සමග සසඳන විට සමුපකාර ආයතන වලට දෙන ලද වාණිජ බැංකු ණය 1984 දී රුපියල් 25 කෝටි 50 ලක්ෂය (සියයට 14) කින් පහත වැටුණි. සමුපකාර ආයතනවල ණය ගැනීම් අඩුවීම ප්‍රධාන වශයෙන්, වී මිළදී ගැනීම හා අලෙවි කිරීම සඳහා වී අලෙවි මණ්ඩලයට දෙන ලද බඩු තොග කුවිතාන්සි අත්තිකාරම් රුපියල් 33 කෝටි 10 ලක්ෂයකින් පහත වැටීම නිසා සිදු විය. වී අලෙවි මණ්ඩලයට දෙන ලද ණය අඩුවීමට හේතු වූයේ, එම ආයතනය අලෙවි කටයුතු වල යෙදීම අඩුවීම සහ 1984 මාර්තු මාසයේදී මහ බැංකුව විසින් ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීම සීමා කිරීමය. 1983 දී වූ රුපියල් 29 කෝටි 20 ලක්ෂය (සියයට 6) ක අඩුවීම සමග සසඳන විට, රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය 1984 දී රුපියල් 23 කෝටි 70 ලක්ෂය (සියයට 6) කින් අඩු විය. මෙම අඩුවීම, රුපියල් 52 කෝටි 20 ලක්ෂයකින් අයිරා අඩුවීමේ සහ ණය, මුදල් ශීර්ෂ හා ආනයන බිල්පත් රුපියල් 28 කෝටි 50 ලක්ෂයකින් වර්ධනය වීමෙහි ශුද්ධ ප්‍රතිඵලය විය. අයිරා ප්‍රමාණය අඩුවීමට දායක වූ ප්‍රධාන සාධකය වූයේ, වැවිලි සංස්ථා දෙක, ඔවුන්ගේ මූල්‍ය තත්ත්වය වැඩි දියුණු වීම නිසා එතෙක් නොපියවා පැවති වාණිජ බැංකු ණය පියවීමයි. එයට අමතරව, පසුගිය වර්ෂයන්හිදී මෙන්ම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා නැව් සංස්ථාව සහ ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව වැනි ප්‍රධාන සංස්ථා කිහිපයක් වර්ෂය තුළදී තව දුරටත් විදේශීය ණය මත රඳා පැවතීම හේතු කොටගෙන දේශීය බැංකු ණය මත රඳා පැවැත්ම අඩු විය.

වසර තුළදී දේශීය මිළ මට්ටමෙහි වැඩිවීම සැළකිය යුතු ලෙස අඩුවීම, හේතු කොටගෙන උද්ධමන අනුපාතිකය අඩු විය. මිළ මට්ටම මත ඉල්ලුම් පීඩනයෙහි අඩුවීම පිළිබිඹු කරමින් $M_1$ සහ $M_2$ හි සංසරණ ප්‍රවේගය, 1983 දී පිළිවෙළින් සියයට 8.29 සහ 3.20 සිට 1984 දී සියයට 7.40 සහ 2.83 දක්වා පහත වැටුණි. මෙය, 1983 වර්ෂයේදී වූ සියයට 21 ක වැඩිවීම (ලක්ෂමය පදනම මත) සමග සසඳන විට කොළඹ පාරිභෝගිකයින්ගේ මිළ දර්ශකයෙහි වූ සියයට 9 ක මධ්‍යස්ථ වර්ධනය තුළින් පිළිබිඹු කෙරුණි. කෙසේ වුව ද, වසරේ පළමු භාගය තුළදී මිළ මත පැවති සැළකිය යුතු පීඩනය පිළිබිඹු කරමින්, කොළඹ පාරිභෝගිකයින්ගේ මිළ දර්ශකයේ සාමාන්‍ය වාර්ෂික වර්ධනය , 1983 දී වූ සියයට 14 සමග සසඳන විට 1984 දී සියයට 17 ක් විය.

## බැංකු විදේශීය වත්කම් (ශුද්ධ)

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව

## 1.46 සංඛ්‍යා සටහන

## මූල්‍ය සමස්තයන් සහ ඒවාට තුඩුදුන් සාධක

(ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ)

| ශීර්ෂය | 1982 දෙසැම්බර් | 1983 දෙසැම්බර් | 1984 දෙසැම්බර් | 1982/1983 වෙනස | | 1983/1984 වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | | | | ප්‍රමාණය | ප්‍රතිශතය | ප්‍රමාණය | ප්‍රතිශතය |
| **මූල්‍ය සමස්තයන්** | | | | | | | |
| 1. මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් .. .. | 5,987·7 | 7,200·1 | 8,560·9 | + 1,212·4 | + 20·3 | + 1,360·8 | + 18·9 |
| 2. මහජනයා වෙතැති ඉල්ලුම් තැන්පතු .. .. | 5,772·1 | 7,547·8 | 8,262·9 | + 1,775·7 | + 30·8 | + 715·2 | + 9·5 |
| පටු මුදල් සැපයුම ($M_1$) .. .. | 11,759·8 | 14,747·9 | 16,823·8 | + 2,988·1 | + 25·4 | + 2,076·0 | + 14·1 |
| 3. වාණිජ බැංකු වෙතැති මහජනයා සතු කාලීන සහ ඉතිරි කිරීමේ තැන්පතු .. .. | 18,750·1 | 22,509·0 | 26,603·5 | + 3,758·9 | + 20·0 | + 4,094·5 | + 18·2 |
| 3·1 සමූපකාර ආයතන .. .. | 357·3 | 469·2 | 526·8 | + 111·9 | + 31·3 | + 57·6 | + 12·3 |
| 3·2 රාජ්‍ය සංස්ථා .. .. | 4,257·8 | 4,081·1 | 5,508·8 | - 176·7 | - 4·2 | + 1,427·7 | + 35·0 |
| 3·3 පෞද්ගලික අංශයේ අනෙකුත් ගණුදෙනුකරුවන්* .. | 14,135·0 | 17,958·7 | 20,567·9 | + 3,823·7 | + 27·1 | + 2,609·2 | + 14·6 |
| පුළුල් මුදල් සැපයුම ($M_2$) .. .. | **30,509·9** | **37,256·9** | **43,427·3** | **+ 6,747·0** | **+ 22·1** | **+ 6,170·5** | **+ 16·6** |
| **තුඩුදුන් සාධක** | | | | | | | |
| 1. දේශීය ණය ප්‍රසාරණය (DCE) .. .. | 42,397·6 | 49,293·0 | 49,926·2 | + 6,895·4 | + 16·3 | + 633·2 | + 1·3 |
| 1.1 රජයට දෙන ලද ශුද්ධ ණය .. .. | 17,150·2 | 17,533·1 | 14,554·4 | + 382·9 | + 2·2 | - 2,978·7 | - 17·0 |
| 1·1·1 රජයට දෙන ලද දළ ණය .. .. | 19,719·8 | 20,972·1 | 18,164·6 | + 1,252·3 | + 6·4 | - 2,807·5 | - 13·4 |
| මහ බැංකුව විසින් .. | 18,000·5 | 19,393·0 | 15,249·1 | + 1,392·5 | + 7·7 | - 4,143·9 | - 21·4 |
| වාණිජ බැංකු විසින් .. .. | 1,719·3 | 1,579·1 | 2,915·5 | - 140·2 | - 8·2 | + 1,336·4 | + 84·7 |
| 1·1·2 රජයේ තැන්පතු සහ මුදල් ශේෂ .. | - 2,569·6 | - 3,439·0 | - 3,610·2 | - 869·4 | - 33·8 | - 171·2 | - 5·0 |
| 1·2 පෞද්ගලික අංශයට දෙන ලද දළ ණය .. | 25,247·4 | 31,759·9 | 35,371·8 | + 6,512·4 | + 25·8 | + 3,611·9 | + 11·4 |
| 1·2·1 සමූපකාර ආයතන .. .. | 1,187·7 | 1,822·7 | 1,567·6 | + 634·9 | + 53·5 | - 255·1 | - 14·0 |
| 1·2·2 රාජ්‍ය සංස්ථා .. .. | 4,677·4 | 4,385·2 | 4,148·2 | - 292·3 | - 6·2 | - 236·8 | - 5·5 |
| 1·2·3 පෞද්ගලික අංශයේ අනෙකුත් ගණුදෙනු කරුවන් | 19,382·3 | 25,552·1 | 29,656·0 | + 6,169·8 | + 31·5 | + 4,103·8 | + 16·1 |
| 2. බැංකු විදේශීය වත්කම් (ශුද්ධ) .. .. | 2,371·8 | 3,186·9 | 9,964·1 | + 815·1 | + 34·4 | + 6,777·2 | + 212·7 |
| 3. අනෙකුත් ශීර්ෂ (ශුද්ධ) .. .. | - 14,259·5 | - 15,223·0 | - 16,463·0 | - 963·5 | | - 1,239·9 | |
| 3·1 මහ බැංකුවෙහි අනෙකුත් වගකීම් (ශුද්ධ) .. | - 9,382·7 | - 9,417·4 | - 9,982·6 | - 34·6 | | - 565·2 | |
| 3·2 වාණිජ බැංකුවල අනෙකුත් වගකීම් (ශුද්ධ) .. | - 4,891·2 | - 6,319·3 | - 6,506·3 | - 1,428·1 | | - 186·9 | |
| 3·3 හුවමාරුවෙමින් පවත්නා ශීර්ෂයන් සඳහා ගැලපිලි .. | 14·4 | 513·7 | 25·9 | + 499·3 | | - 487·8 | |
| පුළුල් මුදල් සැපයුම ($M_2$) .. .. | **30,509·9** | **37,256·9** | **43,427·3** | **+ 6,747·0** | **+ 22·1** | **+ 6,170·5** | **+ 16·6** |

සටහන : සළකුණු වලින් $M_2$ කෙරෙහි ඇති වූ බලපෑම දක්වේ.

* නිර්නේවාසිකයන්ගේ විදේශීය ව්‍යවහාර මුදල් තැන්පතු ඇතුළත් නොවේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

**වාණිජ බැංකු කටයුතු**

1984 වර්ෂයේදී වාණිජ බැංකු අංශයෙහි දක්නට ලැබුනු විශේෂතම ලක්ෂණය වූයේ වර්ෂය පුරාම බැංකු විසින් අත්දකින ලද අධි ද්‍රවශීලතා තත්ත්වයයි. මෙයට ප්‍රධානම හේතුව වූයේ විදේශීය ඉපයීම් වැඩිවීම මගින් නොකඩවා ගලා ආ ද්‍රවශීලතාවත්, ඉහළ තැන්පතු අනුපාතිකයන් හේතු කොට ගෙන වර්ෂය ආරම්භයේදී ඉහළ ගිය තැන්පතු රාශිකරණයත් ය. 1983 අවසාන කාලයේ දී දණ්ඩන පොළී අනුපාතික යටතේ වාණිජ බැංකු වලට දෙනු ලැබූ තාවකාලික ණය පහසුකම ඉවත් කිරීම නිසා, වාණිජ බැංකු තැන්පතු රාශිකරණය වැඩි කිරීම මගින් ඔවුන්ගේ ද්‍රවශීලතා තත්ත්වය වර්ධනය කරගැනීමට පෙළඹුණි. ඒ අනුව රාජ්‍ය බැංකු දෙක ඇතුළුව බැංකු බොහොමයක්, 1984 ආරම්භයේදී ස්ථාවර හා ඉතිරිකිරීමේ තැන්පතු සඳහා වූ පොළී අනුපාතිකයන්, විශේෂයෙන් ම කෙටි කාලීන තැන්පතු සඳහා වූ අනුපාතිකයන් වැඩි කරනු ලැබිය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පෞද්ගලික අංශය සතු කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු වර්ෂයේ මුල් භාගයේ දී රුපියල් 241 කෝටි 30 ලක්ෂයකින් වැඩිවිය. තවද, ප්‍රමුඛතා නොවන අංශ සඳහා ණය දීම මත පැනවූ සීමාවන් මගින් වාණිජ බැංකුවල ණය දීමේ කටයුතු සීමා කෙරුන අතර, එයද අධි ද්‍රවශීලතා තත්ත්වය සඳහා දායක විය.

අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳ පොළෙහි ගණුදෙනු මගින් වාණිජ බැංකුවල අධි ද්‍රවශීලතා තත්ත්වය මනාව පෙන්නුම් කෙරුණි. කෙටි කාලීන අරමුදල් සඳහා වූ ඉල්ලුමෙහි පහත වැටීමක් පිළිබිඹු කරමින්, මෙම වෙළෙඳ පොළෙහි ගණුදෙනු, වර්ෂයේ දෙවන භාගය වන විට අඩුවීමක් පෙන්නුම් කළේය. ඒ අනුව, 1983 අවසානයේ දී වර්ෂයකට සියයට 20 සිට 37 ක පරතරයක පැවති මෙකී වෙළෙඳ පොළ පොළී අනුපාතිකයන් 1984 දෙසැම්බර් අවසානයේ දී වර්ෂයකට සියයට 14 සිට 15.05 ක පරතරයක් දක්වා අඩු විය. වාණිජ බැංකුවල අධි ද්‍රවශීලතා තත්ත්වය ද්විතීයික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ පොළෙහි වැඩි වූ ගණුදෙනු මගින් ද පිළිබිඹු විය. වාණිජ බැංකු බොහොමයක් ඔවුන්ගේ අතිරික්ත අරමුදල් යෙදවීමට සුදුසු වෙළෙඳ පොළක් වශයෙන් ද්විතීයික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ පොළ තෝරා ගත් අතර, 1983 දෙසැම්බර් අවසානයේ දී රුපියල් පන්-කෝටි අනූ ලක්ෂයක්ව පැවති මෙම වෙළෙඳ පොළෙහි ශුද්ධ විකුණුම්, 1984 අවසානය වන විට රුපියල් 156 කෝටි 30 ලක්ෂයක් දක්වා සැළකිය යුතු ලෙස වර්ධනය විය. ද්‍රවශීල වත්කම් හා ඉල්ලුම් තැන්පතු අතර අනුපාතය 1983 දී වූ සියයට 128 සිට 1984 දෙසැම්බර් වන විට සියයට 136 දක්වා වර්ධනය වීම මගින් ද වාණිජ බැංකු විසින් අත් දකින ලද අධි ද්‍රවශීලතා තත්ත්වය පිළිබිඹු විය.

බැංකු ක්‍රමය වෙත සැඟවුනු මුදල් ඇදගනිමින් වාණිජ බැංකු තවදුරටත් තැන්පතු සහතික නිකුත්කිරීම මගින් තැන්පතු රාශිකරණයෙහි යෙදුණි. 1983 දී වූ රුපියල් 61 කෝටිය සමග සසඳන විට 1984 අවසානයේ දී නොපියවා පැවති තැන්පතු සහතික පත් ප්‍රමාණය රුපියල් 90 කෝටි 80 ලක්ෂයක් විය. බැංකු සේවාවන් දියුණු කරමින් සමහර බැංකු ඔවුන්ගේ ඇතැම් ශාඛාවල ගණුදෙනු කරන සේවා කාලය දීර්ඝ කළහ.

වර්ෂය තුළදී, පීපල්ස් මර්චන්ට් බැන්ක් ලිමිටඩ් සහ මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ් යන වණික් බැංකු දෙක ඔවුන්ගේ කටයුතු පුළුල් කිරීමෙහි යෙදුණි. පීපල්ස් මර්චන්ට් බැන්ක් ලිමිටඩ්, අපනයන නිෂ්පාදන ව්‍යාපෘති දියුණු කිරීම, ව්‍යාපෘති හඳුනාගැනීම හා ණය සමූහකරණයෙහි යෙදුනු අතර, මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ් එහි විශේෂඥ හා උපදේශක සේවාවන්, උපකරණ බදු දීම, වාණිජ බිල්පත් වට්ටම් කිරීම හා නැරඹකාර කටයුතු දක්වා විවිධාංගීකරණය කරන ලදී.

මිඩ්ල් ඊස්ට් බැංකුවෙහි විදේශීය ව්‍යවහාර මුදල් බැංකු කටයුතු ඒකකයක් විවෘත කිරීමත් සමගම, 1984 අවසානය වන විට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වෙමින් පැවති විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක ගණන 25 ක් බවට පත් විය. පසුගිය වර්ෂයේ දී මෙන්ම, මෙම ඒකකයන්හි ක්‍රියාකාරිත්වයන් මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළේය. විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හි මුළු වත්කම් / වගකීම් 1984 අවසානය වන විට රුපියල් 1987 කෝටිය (ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 75 කෝටි 60 ලක්ෂය) ක් විය.

1983 දී වූ රුපියල් 1,018 කෝටි 80 ලක්ෂයක ඉහළ වර්ධනයක් සමග සසඳන විට 1984 දී වාණිජ බැංකු සම්පත් හි වැඩිවීම රුපියල් 617 කෝටි 10 ලක්ෂයක් විය. වර්ෂය තුළදී මුළු තැන්පතු ප්‍රමාණය රුපියල් 584 කෝටි 30 ලක්ෂයකින් වර්ධනය විය. 1984 දී වාණිජ බැංකුවල ද්‍රවශීලතා තත්ත්වයෙහි වැඩිවීම පිළිබිඹු කරමින් දේශීය හා විදේශීය බැංකු වලින් වාණිජ බැංකු ණය ගැනීම් පිළිවෙලින් රුපියල් 39 කෝටි 50 ලක්ෂයකින් හා රුපියල් දස කෝටි 60 ලක්ෂයකින් අඩු විය.

වාණිජ බැංකු සම්පත් හා ඒවායේ උපයෝගීකරණයෙහි වෙනස්වීම්, ශුද්ධ පදනමක් මත 1.47 වැනි සංඛ්‍යා සටහනෙහි දැක්වේ. වර්ෂය තුළදී, වාණිජ බැංකුවල සම්පත්හි වර්ධනයට රාජ්‍ය සංස්ථා හා සමුපකාර ආයතන පිළිවෙලින් රුපියල් 173 කෝටි 20 ලක්ෂයකින් හා රුපියල් 33 කෝටි 10 ලක්ෂයකින් ශුද්ධ වශයෙන් දායක විය. ණය සඳහා අනෙකුත් පෞද්ගලික අංශයෙන් වූ ඉල්ලුමෙහි අඩුවීම පිළිබිඹු කරමින් 1983 දී රුපියල් 101 කෝටි 80 ලක්ෂය සමග සසඳන විට 1984 දී අනෙකුත් පෞද්ගලික අංශය විසින් උපයෝගී කරගන්නා ලද වාණිජ බැංකු සම්පත් ප්‍රමාණය රුපියල් 89 කෝටි 50 ලක්ෂයක් පමණක් විය. 1983 දී වාණිජ බැංකු සම්පත් වර්ධනයට කරන ලද දායකත්වයට වෙනස්ව යමින් 1984 දී රාජ්‍ය අංශය, වාණිජ බැංකු සම්පත් රුපියල් 75 කෝටි 40 ලක්ෂයක ප්‍රමාණයක් භාවිතා කර තිබුණි. ප්‍රධාන වශයෙන් ව්‍යවස්ථාපිත සංචිතයන්හි වැඩි වීම සහ ණය ආපසු ගෙවීම හේතු කොට ගෙන වර්ෂය තුළදී, වාණිජ බැංකුවලින් මහ බැංකුව වෙත රුපියල් 111 කෝටි 80 ලක්ෂයක ශුද්ධ සම්පත් ගලා යාමක් දක්නට ලැබුණි.

1.47 සංඛ්‍යා සටහන

වාණිජ බැංකු සම්පත් සහ ඒවා උපයෝගීකරණයේ වෙනස්වීම්.

(රුපියල් දශ ලක්ෂ)

| අංශය | 1982 අග/ 1983 අග | 1983 අග/ 1984 අග |
|---|---|---|
| 1. රජය .. .. | 278·0 | –754·1 |
| 2. මහ බැංකුව .. .. | –41·6 | –1,117·9 |
| 3. රාජ්‍ය සංස්ථා .. .. | 532·3 | 1,732·5 |
| 4. සමුපකාර ආයතන .. .. | –527·5 | 331·2 |
| 5. අනෙකුත් පෞද්ගලික .. .. | –1,018·3 | –895·2 |
| 6. අන්තර් බැංකු .. .. | 1,243·8 | 485·0 |
| 7. විදේශීය .. .. | –466·7 | 218·5 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

සටහන : අඩු කිරීමේ සළකුණින් ශුද්ධ වශයෙන් සම්පත් උපයෝගීකරණයන් දක්වේ.

**බැංකු ශාඛා ව්‍යාප්තිය**

ප්‍රධාන වශයෙන්ම ආරක්ෂක කටයුතු පිළිබඳව සැළකිලිමත්වීම හේතු කොට ගෙන උතුරු, උතුරු මැද හා නැගෙනහිර පළාත් හි බැංකු ශාඛා බොහොමයක් ප්‍රධාන ශාඛා සමග එකට එකතු කිරීම හා ප්‍රතිස්ථාන ගතකිරීම් වසර තුළදී දක්නට ලැබුනු සඳහන් කළ යුතු ලක්ෂණය විය. මුදල් අමාත්‍යාංශයේ සහ මහ බැංකුවේ අනුමැතිය ඇතිව ශාඛා කාර්යාල සමහරක් ප්‍රතිස්ථානගත කිරීම සහ ඉඩ කඩ හා පහසුකම් ඇති ස්ථාන කරා මාරු කිරීම සිදු කෙරුණි.

මෙම එක්කිරීම් හේතු කොට ගෙන වාණිජ බැංකු ශාඛා 12 කින් අඩුවී 1984 අවසානයේ දී ප්‍රති ස්ථානගත කරන ලද කෘෂි සේවා මධ්‍යස්ථාන ද ඇතුළුව මුළු ශාඛා ගණන 1,022 ක් බවට පත් විය. වර්ෂය තුළ දී, වාණිජ බැංකු ශාඛා 24 ක් තවත් ශාඛාවන් සමග ඒකාබද්ධ කරන ලද අතර, මෙයින් ශාඛා 16 ක් මහජන බැංකුවට ද, ශාඛා 7 ක් ලංකා බැංකුවට ද, එක් ශාඛාවක් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට ද අයත් විය. මේ අතර, වර්ෂය තුළදී වාණිජ බැංකු ශාඛා 13 ක් අළුතින් විවෘත කරන ලදී. මෙම බැංකු ශාඛා, ලංකා බැංකුවේ ශාඛා 5 කින් ද, මහජන බැංකුවේ ශාඛා 4 කින් ද, හැටන් නැෂනල් බැංකුවේ ශාඛා 2 කින් ද, සීමාසහිත ලංකා වාණිජ බැංකුවේ සහ බැන්ක් ඔෆ් ක්‍රෙඩිට් ඇන්ඩ් කොමර්ස් ඉන්ටර්නැෂනල් බැංකුවේ ශාඛා එක බැගින් ද සමන්විත විය. වර්ෂය තුළදී, මහජන බැංකුව එහි කොළඹ වරාය ශාඛාව වසා දැමීය. 1984 මැයි මාසයේදී ''බැන්ක් ඔෆ් ක්‍රෙඩිට් ඇන්ඩ් කොමර්ස් ඉන්ටර්නැෂනල් ''බැංකු ශාඛාවක් නිදහස් වෙළෙඳ කලාපයේ පිහිටුවන ලදී. මේ අතර, ඇමෙරිකන් එක්ස්ප්‍රස් ඉන්ටර්නැෂනල් බැන්කින් කෝපරේෂන්හි ආසියානු ප්‍රාදේශීය ශාඛාව කොළඹ නගරයේ පිහිටුවීම අනුමත කරන ලද අතර, එහි කටයුතු, 1984 මැයි මාසයේදී ආරම්භ කරන ලදී. ජාතික ඉතිරිකිරීමේ බැංකුව නව ශාඛා දෙකක් විවෘත කරන ලද අතර, වර්ෂය අවසන් වන විට එහි මුළු ශාඛා ගණන 52 ක් විය.


**පොළී අනුපාතික**

1984 වර්ෂයේදී සමස්ත පොළී අනුපාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන්, තැන්පතු අනුපාතිකයන්හි සැළකිය යුතු වෙනස්වීම් සිදු වූව ද, ණය අනුපාතිකයන්හි සිදුවූයේ සුළු වෙනස්වීම් කිහිපයක් පමණි. නිදහස් ආර්ථික ප්‍රතිපත්තීන් සමග 1977 වර්ෂයේදී හඳුන්වා දෙනු ලැබූ පොළී අනුපාතික සංශෝධනයන්, 1983 සහ 1984 යන වර්ෂ දෙක තුළ වෙනස්කම් කිහිපයකට භාජනය විය. අරමුදල් වල පිරිවැය, වාණිජ බැංකු තැන්පතු හා ණය දීමේ පොළී අනුපාතිකයන් තීරණය කිරීමේ ප්‍රධාන සාධකය විය. ඇතැම් බැංකු සිය පොළී අනුපාතික අඩු කළ අතර, අනෙකුත් බැංකු ඉහළ පොළී අනුපාතිකයන් තව දුරටත් පවත්වා ගැනීම මගින් 1984 දී මෙම තත්ත්වය වඩාත් කැපී පෙනුණි.

අපනයන ආදායම් ඉක්මනින් මෙරටට ගෙන්වා ගැනීමට දිරි දෙනු වස්, 1984 මාර්තු මාසයේදී පොළී ප්‍රතිදාන ක්‍රමය හඳුන්වා දීමත් සමග මහ බැංකුව සිය පොළී අනුපාතික ප්‍රතිපත්තියේ ප්‍රධාන වෙනසක් ඇති කළේය. පූර්ව නැව්ගත කිරීමේ කටයුතු සඳහා වන අපනයන ප්‍රතිමූල්‍ය ණය පහසුකම යටතේ සපයන ණය සඳහා බලපාන පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 12 දක්වා, ප්‍රතිශත අංක 1 කින් අඩු කරනු ලැබීය. බලපාන පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 8.75 දක්වා ප්‍රතිශත අංක 1 කින් අඩු කරමින්, සම්ප්‍රදායික නොවන තෝරාගත් අපනයන සඳහා වූ අතිරේක ප්‍රතිමූල්‍ය පහසුකම් සඳහා ද ඒ හා සමාන සංශෝධනයක් ඇතිකරනු ලැබීය. වගා සහ අලෙවි ප්‍රතිමූල්‍ය පහසුකම් සම්බන්ධව පොළී අනුපාතික නොවෙනස්ව පැවතිය ද, රුපියල් 40 කෝටියක් ඉක්මවා වී අලෙවි මණ්ඩලයට දෙනු ලබන ප්‍රතිමූල්‍ය ණය සඳහා ප්‍රතිශත අංක 2 කින් පොළිය නංවනු ලැබීය. මෙහි අදහස වූයේ වී අලෙවි මණ්ඩලය සඳහා වන ප්‍රතිමූල්‍ය පහසුකම් සීමා කිරීම සහ ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයෙන කාලසීමාව දීර්ඝ කිරීම සඳහා වන ඉල්ලීම් අධෛර්‍ය-මත් කිරීමත්ය.

# පොලී අනුපාතික

කාර්තු අවසානයට පැවති සංඛ්‍යා




ශ්‍රී ලංකා මහ බැංකුව.

පොළී අනුපාතික නියම කිරීම සම්බන්ධව බලධාරීන්ගේ මැදිහත්වීම වර්ෂය තුළදී අඩු වූ බව පැහැදිලි විය. මෙය, ද්‍රවශීලතා අවශ්‍යතාවයන් සහ අරමුදල්වල පිරිවැය සැලකිල්ලට ගෙන වෙළෙඳපොළ බලවේගයන්ට අනුව පොළී අනුපාතික තීරණය කිරීම සඳහා මුදල් වෙළෙඳපොළට කළ ඇහවීමක් විය. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව පොළී අනුපාතික නියම කිරීමේ මෙතෙක් පැවති ක්‍රමයට වෙනස්ව යමින්, ජාතික ඉතිරිකිරීමේ බැංකුවට 1984 අප්‍රේල් මාසයේ දී සිය තැන්පතු සහ ණය දීම පිළිබඳ පොළී අනුපාතික ස්වාධීන ලෙස නියම කිරීමේ නිදහස දෙනු ලැබීය. මෙම ප්‍රතිපත්තිමය වෙනස, රජයේ ණය ගැනීමේ අවශ්‍යතා අඩුවීම සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවට ලාභදායික ක්ෂේත්‍රයන්හි ආයෝජනයට ඉඩ සැළසීමෙන් වත්කම් ව්‍යුහය පුළුල් කිරීමට ඉඩ සැලසීම යන කරුණු දෙක මුල් කරගෙන සිදු විය. ඒ අනුව ජාතික ඉතිරිකිරීමේ බැංකුව මාස 12 ස්ථිර තැන්පතු සඳහා වන පොළී අනුපාතිකය (කල් පිරුණු විට පොළී ගෙවන) 1984 ජූලි මාසයේ සිට බලපැවැත්වෙන පරිදි, වර්ෂයකට සියයට 20 සිට සියයට 18 දක්වා අඩු කරනු ලැබීය. මාස හයක ස්ථිර තැන්පතු සඳහා වන පොළී අනුපාතිකය ද වර්ෂයකට සියයට 14 දක්වා ප්‍රතිශත අංක 1 කින් අඩු කරන ලදී.

කෙටි කාලීන කාරක ප්‍රාග්ධන අවශ්‍යතා ඉහළ යාම නිසා තේ අපනයන කරුවන් වෙතින් අරමුදල් සඳහා වූ ඉල්ලුම වැඩිවීම සහ 1983 සිව් වන කාර්තුවේදී බලපානු ලැබූ මූල්‍ය හා ණය ප්‍රතිපත්ති පියවරයනට ප්‍රතිචාර වශයෙන් ඇතැම් වාණිජ බැංකු ඉහළ පොළී අනුපාතික මත තැන්පතු රැස් කිරීම තුළින් ස්වකීය ද්‍රවශීලතාවය වර්ධනය කිරීමට උත්සාහ දැරීය. කෙසේ වුව ද, තැන්පතු රාශිකරණය පිළිබඳ ඉලක්කයන් සපුරා ගැනීමෙන් පසු තැන්පතු අනුපාතික 1983 අවසාන කාර්තුවේ පැවති මට්ටම දක්වා අඩු කරනු ලැබූ අතර, 1984 දෙවන භාගය තුළ දී ඒවා තව දුරටත් අඩු කරනු ලැබුණි. මෙලෙස, අධි ද්‍රවශීලතා තත්ත්වය සහ සිය තරඟකරුවා වූ ජාතික ඉතිරිකිරීමේ බැංකුව පොළී අනුපාතික අඩු කිරීම මත වාණිජ බැංකු වැඩි සංඛ්‍යාවක් විවිධ අවස්ථාවන්හිදී විවිධ ප්‍රමාණවලින් සිය කෙටි කාලීන තැන්පතු අනුපාතික ව්‍යුහය පහළ මට්ටමකට ගෙන එන ලදී. කෙසේ වුවද, ඇතැම් බැංකු තෝරා ගත් පදනමක් මත ඉහළ පොළී අනුපාතික ගෙවීම දිගටම කරගෙන යනු ලැබීය.

ඒක්ෂණ මුදල් වෙළෙඳපොළෙහි පොළී අනුපාතිකවල නොකඩවා සිදුවූ පහත වැටීමේ උපනතියද මේ සමගම වාගේ සිදු වූ ද්විතීය භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළෙහි විකුණුම් හි (ශුද්ධ) වැඩිවීම ද, බැංකු අංශයේ වර්ධනය වූ අධි ද්‍රවශීල තත්ත්වය පෙන්නුම් කළේය. මේ අනුව වෙළෙඳපොළ බලවේගයන් 1985 ප්‍රථම භාගයේදී තැන්පතු පොළී අනුපාතික තව දුරටත් පහත හෙළීමට හේතුවිය හැක.

වර්ධනයවූ ද්‍රවශීලතා තත්ත්වය හේතුවෙන් ස්වකීය ණය පොළී අනුපාතික සම්බන්ධව අපේක්ෂා කළ ක්ෂනික ප්‍රතික්‍රියාව වාණිජ බැංකුවලින් සිදු නොවීය. ඇත්තෙන්ම, තෝරා ගත් පදනමක් මත, අතරින් පතර කරනු ලැබූ සුළු වෙනස්කම් හැර සාමාන්‍යයෙන් කිසිදු වාණිජ බැංකුවක් ණය දීමේ පොළී අනුපාතිකයන්හි පොදු අඩුකිරීමක් කරනු නො ලැබීය. වාණිජ බැංකු, වසරේ දෙවන භාගය මුළුල්ලේම තැන්පතු පොළී අනුපාතික අඩු කරන්නට යෙදුණි. කෙසේ වුවද, මාස හයේ තැන්පතු කල් පිරීම සහ අඩු පොළී අනුපාතිකයක් මත නව තැන්පතු බාර ගැනීම හේතුවෙන් 1984 වර්ෂය අවසානයේදී සහ 1985 වර්ෂය ආරම්භයේදී තැන්පතු රාශිකරණ පිරිවැයෙහි අඩුවීමක් පෙනෙන්නට තිබුණි. ප්‍රමාණවත් පරිදි ඉතිරි කිරීම් සහ ආයෝජනය කිරීමේ ක්ෂේත්‍රයන් නොමැති වීම හේතුවෙන් මහ ජනතාව පොළී උපයන මූල්‍ය වත්කම්, එනම් ඉතිරිකිරීමේ හා ස්ථාවර තැන්පතු දැරීමට ඇති දැඩි කැමැත්ත, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් පැහැදිලිව පෙනෙන්නකි. මෙය, විශේෂයෙන්ම උද්ධමනකාරී අපේක්ෂාවන් අඩු වූ අවස්ථාවන්හිදී වඩාත් පැහැදිලිය. මෙම පසුබිම තුළ, අඩු කරන ලද පොළී අනුපාතිකයන් මත වුව ද මූල්‍ය ඉතිරිකිරීම් ඇදගැනීමට වාණිජ බැංකු තවමත් සමත් වේ.

මහ බැංකුව වෙතැති, විශේෂ තැන්පතු ඇතුළුව සංචිත වර්ධනය මගින් වාණිජ බැංකුවල ණය මැවීමේ ධාරිතාව අඩු කළ අතර, පොලී අනුපාතිකය ඒ අනුව යළි සකසා ගැනීමට වාණිජ බැංකු වලට කළ ඇඟවීමක්ද විය. මූල්‍ය ප්‍රතිපත්තීන්ට සහ වෙළෙඳපොළ තත්ත්ව-යන්ට අනුව වාණිජ බැංකු ස්වකීය තැන්පතු අනුපාතික අඩු කරන ලදී. කෙසේ වුවද, ප්‍රධාන හේතු දෙකක් නිසා, ණය දීමේ අනුපාතිකයන්හි සාමාන්‍ය අඩුවීමක් ක්ෂනිකව සිදුකළ නොහැකිවිය. පළමුව, ඉහළ පොලී අනුපාතිකය මත රැස්කළ තැන්පතු සම්බන්ධව වාණිජ බැංකු බැඳී සිටීම නිසා වාණිජ බැංකු තැන්පතු රාශිකරණ පිරිවැය ඉහළ මට්ටමක පැවතුණි. දෙවනුව, ආරක්ෂක වැඩ කටයුතු ඉහළ යාම සහ ආයතනික පිරිවැය ඉහළ යාමත් නිසා අරමුදල් පිරිවැය ඉහළ මට්ටමක පැවතුණි.

රජයේ ණය ගැනීමේ පොලී අනුපාතිකය සහ වෙළෙඳපොළ ණය ගැනීමේ පොලී අනුපාතිකය අතර පරතරය අඩු කරමින් රාජ්‍ය ණය (රජයේ සුරැකුම්පත් සහ භාණ්ඩාගාර බිල්පත්) සඳහා වන පොලී අනුපාතිකයන් වර්ෂය තුළදී ඉහළ නැංවෙන පරිදි සංශෝධනය කරනු ලැබිය. අරමුදල්වල නියම පිරිවැය පිළිබිඹුවන පරිදි වෙළෙඳපොළ අනුපාතිකයන් මත ණය ගැනීමට වූ රජයේ අභිලාශය, මෙම සංශෝධන වලට මූලික හේතුව විය. ඒ අනුව, 1984 අගෝස්තු මාසයේදී රජයේ සුරැකුම්පත් සම්බන්ධව කල් පිරීමේ කාලච්ඡේදය වර්ෂ 5 සිට 6 දක්වා දීර්ඝ කරන ලද අතර, පොලී අනුපාතිකය වර්ෂයකට සියයට 16 දක්වා ප්‍රතිශත අංක 2 කින් වැඩි කරනු ලැබිය. තවද, වර්ෂය තුළදී ප්‍රාථමික හා ද්විතියික භාණ්-ඩාගාර බිල්පත් වෙළෙඳපොළවල් දෙකෙහිම භාණ්ඩාගාර බිල්පත් පිළිබඳ පොලී අනුපාතිකය වර්ෂයකට සියයට 14 දක්වා ප්‍රතිශත අංක 2 කින් ඉහළ නංවනු ලැබීය. මෙම නව භාණ්ඩාගාර බිල්පත් අනුපාතිකය වාණිජ බැංකුවල තුන් මාසික සහ හය මාසික ස්ථාවර තැන්පතු පොලී අනුපාතිකය සමග තියුණු ලෙස තරඟකාරී වූ අතර, රජයේ සුරැකුම්පත් පිළිබඳ නව අනුපාතිකය බොහෝ වාණිජ බැංකු මගින් දෙනු ලබන දොළොස් මාසික ස්ථාවර තැන්පතු අනුපාතික සමග සම කළහැකි තත්ත්වයක විය.

**මහ බැංකු කටයුතු**

1984 වසර අවසානයේදී මහ බැංකුවේ මුළු වත්කම්/වගකීම් රුපියල් 3,327 කෝටි 20 ලක්ෂයක් විය. පසුගිය වසරේදී වූ වැඩිවීම වන රුපියල් 293 කෝටිය (සියයට 10) හා සසඳන කල මෙම වර්ෂයේදී වත්කම්/වගකීම් සුළු වශයෙන් රුපියල් 17 කෝටි 50 ලක්ෂය (සියයට 0.5) කින් ඉහළ ගියේය. මෙය, ප්‍රධාන වශයෙන්, මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතය රුපියල් 531 කෝටි 70 ලක්ෂයකින් වැඩිවීම සහ දේශීය වත්කම් රුපියල් 514 කෝටි 20 ලක්ෂයකින් අඩුවීම හේතු කොට ගෙන විය.

වත්කම් පැත්තෙහි වූ ඉතා සැළකිය යුතු සාධකය වූයේ, 1983 වර්ෂයේදී වූ රුපියල් 15 කෝටි 10 ලක්ෂයක ඉතා අඩු වර්ධනයක් සමග සසඳන විට, සැළකිය යුතු වර්ධනයක් දක්වූ ජාත්‍යන්තර සංචිතයයි. ජාත්‍යන්තර සංචිතයේ මෙම වැඩිවීම ප්‍රධාන වශයෙන්, පිටරටවල ඇති මුදල් සහ ශේෂ දැරීම් (රුපියල් 383 කෝටි 90 ලක්ෂය) සහ විදේශීය රාජ්‍ය යන්හි සුරැකුම්පත් සහ භාණ්ඩාගාර බිල්පත් (රුපියල් 149 කෝටි 30 ලක්ෂය) කින් වර්ධනය වීම හේතු කොට ගෙන විය. මෙයින් පළමුවැන්නෙහි වර්ධනයට මූලික හේතුව වූයේ, වාණිජ බැංකු වලින් විදේශීය විනිමය මිළට ගැනීම් (ශුද්ධ) සැළකිය යුතු ලෙස වැඩිවීමය. කෙසේ වුවද, මෙම වසරේ විශේෂ ගැනුම් හිමිකම් රුපියල් එක්කෝටි 50 ලක්ෂයකින් පහත වැටුණි.

ජාත්‍යන්තර සංචිතයේ සැළකිය යුතු වැඩිවීම හා සැසඳීමේ දී, වත්කම් පැත්තෙහි වූ අනෙත් කැපී පෙනෙන ලක්ෂණය වූයේ 1983 වර්ෂයේදී වූ රුපියල් 277 කෝටි 90 ලක්ෂයක වැඩිවීමට විරුද්ධව, මහ බැංකුවේ දේශීය වත්කම් රුපියල් 514 කෝටි 20 ලක්ෂයකින් අඩු වීමයි. මෙය, මූලික වශයෙන්ම රජය සහ රජය සහතික කළ සුරැකුම්පත් දැරීම් රුපියල් 539 කෝටි 30 ලක්ෂයකින් සැළකිය යුතු ලෙස අඩු වීම හේතු කොටගෙන සිදුවූවකි.

ද්විතීයික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළෙහි ගණුදෙනු 1984 වර්ෂයේදී වේගයෙන් ඉහළ නැගුනු අතර, මහ බැංකුවේ ශුද්ධ විකුණුම් 1983 දී වූ රුපියල් පන්කෝටි 90 ලක්ෂය සමග සසඳන විට, 1984 දී රුපියල් 156 කෝටි 30 ලක්ෂයක් විය. දේශීය වත්කම් වර්ධනය සීමා කෙරුනු තවත් සාධකයක් වූයේ වාණිජ බැංකු වලට සහ අනෙකුත් මූල්‍යායතනවලට දුන් ණය රුපියල් 63 කෝටි 30 ලක්ෂයකින් අඩුවීමයි. මෙය, කෙටිකාලීන අත්තිකාරම් රුපියල් 65 කෝටි 90 ලක්ෂයකින් පහත වැටීමේ සහ මැදි සහ දිගුකාලීන ණය රුපියල් දෙකෝටි 60 ලක්ෂයකින් සුළු වශයෙන් වැඩිවීමේත් ශුද්ධ ප්‍රතිඵලය විය. කෙටිකාලීන අත්තිකාරම් පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ සහතික මිළ ක්‍රමය යටතේ වී අලෙවි මණ්ඩලයට සපයන ලද ප්‍රතිමූල්‍ය ණය පහසුකම් අඩු කිරීම සහ වාණිජ බැංකුවලට දී තිබුණු සාමාන්‍ය ණය පහසුකම් ඉවත් කිරීමය. ඒ හැරුනු විට, මහ බැංකුවේ අනෙකුත් වත්කම් හා ගිණුම් ද 1984 වර්ෂයේ දී රුපියල් 36 කෝටි 60 ලක්ෂයකින් පහත වැටුණි.

වගකීම් අංශයෙහි, සංසරණයෙහි පවත්නා මුදල් සහ තැන්පතුවලින් සමන්විත වන මූල්‍ය වගකීම් 1983 දී වූ රුපියල් 307 කෝටි 40 ලක්ෂයක වර්ධනය හා සසඳන විට, 1984 දී රුපියල් 182 කෝටි 60 ලක්ෂයකින් වර්ධනය විය. සංසරණයෙහි පවත්නා මුදල් දළ වශයෙන්, පසුගිය වර්ෂයේ වර්ධනය හා සමානුපාතිකව මෙම වසරේදී රුපියල් 142 කෝටි 60 ලක්ෂයකින් වර්ධනය විය. මහ බැංකුව වෙතැති රජයේ තැන්පතු, 1983 දී වූ රුපියල් 73 කෝටි 20 ලක්ෂයක වර්ධනයක් සමග සසඳන විට, 1984 දී රුපියල් 41 කෝටි 40 ලක්ෂයකින් පහත වැටුනු අතර, මහ බැංකුව වෙතැති වාණිජ බැංකු තැන්පතු, 1983 දී රුපියල 117 කෝටියක වර්ධනයක් සමග සසඳන විට 1984 දී රුපියල් 61 කෝටි 20 ලක්ෂයකින් වර්ධනය විය. පිටරටවලින් ණය ගැනීම් සහ අනෙකුත් වගකීම් හා ගිණුම් පිළිවෙළින් රුපියල් 186 කෝටියකින් සහ රුපියල් 34 කෝටි 90 ලක්ෂයකින් පහත වැටුණි. රටෙහි ඉහළ ගිය විදේශීය සංචිත තත්ත්වය පිළිබිඹු කරමින් 1984 දී විදේශීය ණය ගැනීම් මුළුමනින්ම වාගේ නො සැළකිය යුතු තරම් විය.

## මූල්‍ය ප්‍රතිපත්ති

1984 වර්ෂයේදී හඳුන්වා දෙන ලද මූල්‍ය ප්‍රතිපත්තීන් මගින්, ආර්ථිකයේ අධි ද්‍රවශීලතා තත්ත්වය මධ්‍යයේ මූල්‍ය ස්ථායිතාවය මෙන්ම, සංවර්ධන පරමාර්ථයන් ළඟා කර ගැනීමේ ප්‍රයත්නයක් පෙන්නුම් කෙරුණි. මෙම අරමුණු සඳහා, 1983 වර්ෂයේදී හඳුන්වා දෙන ලද මූල්‍ය ප්‍රතිපත්තීන්, මූල්‍ය අංශයෙහි දක්නට ලැබුණු විවිධ තත්ත්වයන්ට අනුකූලව වැඩි දුරටත් ශක්තිමත් කරමින්. 1984 වර්ෂයේ දී ද තව දුරටත් ක්‍රියාත්මක කෙරුණි.

සංචිත මුදල් (මූල්‍ය පදනම) වර්ධනයේ ප්‍රතිඵලයක් වශයෙන් මූල්‍ය ස්ථායිතාවය කෙරේ ඇතිවන අහිතකර තත්ත්වය අඩු කිරීම පිණිස, මහ බැංකුව විසින්, 1984 මාර්තු මස 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, වී අලෙවි මණ්ඩලයට සපයන ලද ප්‍රතිමූල්‍ය පහසුකම් සම්බන්ධයෙන් රුපියල් 40 කෝටියක ඉහළ සීමාවක් පනවන ලදී. බැංකු පොළී අනුපාතිකය යටතේ වාණිජ බැංකු වලට සපයන ලද සාමාන්‍ය ණය පහසුකම ඉවත් කළ අතර, එයට සමාන ප්‍රමාණයකින් පෙර-නැව් අපනයන ණය ප්‍රතිමූල්‍ය පහසුකම් වැඩි කරන ලදී. එයට අමතරව, එක් අතකින් ප්‍රමුඛ නොවන අංශයන් සඳහා අරමුදල් ඉල්ලුම සීමා කිරීමේ අදහසින් සහ අනෙක් අතට, ප්‍රමුඛතා අංශයන්ට ප්‍රමාණවත් ණය සැපයුමක් සහතික කරනු පිණිස, මහ බැංකුව, වරණාත්මක ණය පාලන ක්‍රම ගණනාවක් උපයෝගී කරගන්නා ලදී. ආර්ථිකයේ සැපයුම් අංශ දිරිගැන්වීම සහ එමගින් ආර්ථික වර්ධනය අත්කර ගැනීම සඳහා වන ප්‍රයත්නයක් ලෙස අපනයන අංශයට ණය ගලා යාම වැඩි කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් සැපයෙන අපනයන ප්‍රතිමූල්‍ය ණය පහසුකම් වැඩි කරන ලදී. අපනයන මිළ ඉහළ යාමේ ප්‍රතිඵලයක් වශයෙන්, වැඩිවූ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයන් පියවා ගැනීමට, තේ අපනයනය සඳහාම වෙන් වූ රුපියල් 35 කෝටියක

අමතර පහසුකම් සැපයීමද, පූර්ව නැව්ගත කිරීම් සඳහා වන අපනයන ප්‍රතිමූල්‍ය පහසුකම තව දුරටත් රුපියල් දසකෝටි 80 ලක්ෂයකින් නැංවීමද සිදු කෙරුණි. මෙකී වෙනස් කිරීම් සමග, මුළු අපනයන ණය ප්‍රතිමූල්‍ය සඳහා වූ පහසුකම් ප්‍රමාණය රුපියල් 177 කෝටි 80 ලක්ෂය දක්වා වැඩි වුණි.

ප්‍රතිමූල්‍ය පහසුකම් පුළුල් කිරීමට අමතරව, අපනයන අංශය සම්බන්ධයෙන් තවත් සමහර ප්‍රතිපත්තිමය පියවරයන් ද ක්‍රියාත්මක කරන ලදී. පළමුව, මුදලේ අගය වෙනස්වීම හේතුවෙන් ඇතිවිය හැකි විනිමය අවදානම් වලින් අපනයනකරුවන් ආරක්ෂා කිරීමට සහ විනිමය අනුපාතිකය සම්බන්ධ සමපේක්ෂණ කටයුතු වැලැක්වීමට, 1984 මාර්තු මස 26 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, අපනයනකරුවන්ගේ අපනයන ලැබීම් මත ඉදිරි විකුණුම් ගිවිසුමක් ඇති කරගැනීමට සියළුම අපනයන කරුවන්ට බල කෙරෙන පරිදි, මහ බැංකුව මගින් වාණිජ බැංකු වෙත උපදෙස් නිකුත් කරන්නට යෙදුණි. කෙසේ වුව ද, වටිනාකම රුපියල් පන්ලක්ෂය-කට වඩා අඩු අපනයන ආදායම් උපයන්නන් මෙකී අවශ්‍යතාවයෙන් නිදහස් කෙරුණි. එදින සිටම බලපැවැත්වෙන පරිදි, පූර්ව නැව්ගතකිරීමේ ප්‍රතිමූල්‍ය ණය පහසුකම සඳහා වූ කාලච්ඡේදය දින 90 සිට දින 60 දක්වා අඩු කරන ලදී. මෙම වෙනස්කම් සමග අපනයන කරුවන්ට, අපනයන ආදායම නියමිත කාලයට මෙරටට ගෙන ඒමට දිරි දීමක් වශයෙන්, මහ බැංකුව විසින් පොළී ප්‍රතිදාන ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මෙම පොළී ප්‍රතිදාන ක්‍රමය හඳුන්වා දීමත් සමග, මහ බැංකුව විසින් පෙර නැව් අපනයන ණය පහසුකම් සඳහා වන ප්‍රතිමූල්‍ය අනුපාතිකය වර්ෂයකට සියයට 10 සිට සියයට 13 දක්වා වැඩි කළ අතර, වාණිජ බැංකු විසින් එම ණය අපනයන කරු-වන්ට සැපයීමේදී අයකරන පොළී අනුපාතිකය සියයට 13 සිට සියයට 16 දක්වා වැඩි කෙරුණි. කෙසේ වුවද, නිර්යාත ආදායම් නියමිත කාලයක් තුළ මෙරටට ගෙනඑනු ලබන අපනයන කරුවන්ට දෙනු ලබන වර්ෂයකට සියයට 4 ක පොළී ප්‍රතිදානය හේතු කොටගෙන ඔවුනට දැරීමට සිදුවන ණය පිරිවැය සියයට අංක එකකින් අඩු විය. අතිරේක ප්‍රතිමූල්‍ය පහසුකම් සම්බන්ධයෙන්ද මෙයට සමාන වෙනස්කම් සිදුකළ අතර, වට්ටම් අනුපාතිකය වර්ෂයකට සියයට 7 සිට සියයට 10 දක්වා ද වාණිජ බැංකු අපනයන කරුවන්ට ණය දීමේ අනුපාතිකය වර්ෂයකට සියයට 9.75 සිට සියයට 12.75 දක්වාද වැඩි කෙරුණි. වර්ෂයකට සියයට 4 ක පොළී ප්‍රතිදානය යටතේ මෙම ක්‍රමය මගින්ද ණය ගැනීමේ පිරිවැය සියයට අංක එකකින් අඩු විය.

අත්‍යාවශ්‍ය නොවන ආනයන ණය ප්‍රසාරණය සීමාකිරීමේ අදහසින්, මහ බැංකුව විසින් එම ආනයන සඳහා දෙනු ලබන වාණිජ බැංකු ණය සම්බන්ධව සීමාවන් පනවන ලදී. ඒ අනුව, ආහාර සහ ආහාර ද්‍රව්‍ය, අමු ද්‍රව්‍ය, අමතර කොටස් සහ අන්තර් භාණ්ඩ බෙහෙත් සහ ඖෂධ, පොත් සහ පත්‍රිකා, ප්‍රාග්ධන භාණ්ඩ සහ ඒවායෙහි කොටස් හැර අනෙකුත් ආනයන භාණ්ඩ සඳහා වාණිජ බැංකු විසින් දෙනු ලබන මුළු අත්තිකාරම් ප්‍රමාණය, 1984 මාර්තු මස 23 වැනි දිනට දෙනු ලැබූ සහ නොපියවන ලද එම මුළු අත්තිකාරම් ප්‍රමාණය නොඉක්මවිය යුතු යයි දැනුම් දෙන ලදී. එයට අමතරව, අත්‍යාවශ්‍ය නොවන ආනයන සඳහා ඉදිරි විනිමය පහසුකම් නොසපයන ලෙස සහ එම ආනයන සඳහා එක් ආනයන කරුවකුට දෙනු ලබන ණය, 1984 මාර්තු මස 23 වැනි දින පැවති මට්ටමට වඩා නොසපයන ලෙසටත්, වානිජ බැංකු වලින් ඉල්ලා සිටින ලදී.

මූල්‍ය සමාගම්හි තැන්පතු කරුවන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා, 1984 වර්ෂයේ දී මහ බැංකුව විසින් සමහර ප්‍රතිපත්තිමය පියවරයන් ක්‍රියාවෙහි යෙදවීය. වාණිජ බැංකු මත පනවන ලද ඉහළ සංචිත අවශ්‍යතාවයන් හා සසඳන විට, මූල්‍ය සමාගම් මත පනවන ලද, මුළු තැන්පතු වලින් සියයට 5 ක් වූ ද්‍රවශීලතා අනුපාතිකය එකී සමාගම්හි තැන්පතුකරුවන්ගේ අයිතීන් සුරැකීමට ප්‍රමාණවත් නොවන බව සැළකුණි. එම නිසා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, සියළුම මූල්‍ය සමාගම් ඔවුන්ගේ වගකීම් සපුරා ලීමට හැකි වන පරිදි, ප්‍රමාණවත් ද්‍රවශීලතා අනුපාතිකයක් පවත්වාගෙන යන ලෙස ඉල්ලා සිටිමින්, ඔවුන්ගේ මුළු තැන්පතුවලින් අඩුම වශයෙන් සියයට 10 ක් ද්‍රවශීල වත්කම් ලෙස පවත්වා ගන්නා ලෙස උපදෙස් දුණි. එයට අමතරව, ඉකුත් මුදල්

වර්ෂයේ මාස දොළහ තුළදී, මාසය අවසානයට පැවති තැන්පතු වගකීම්හි සාමාන්‍යයෙන්, සියයට 3 කට සමාන ප්‍රමාණයක් ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර බිල්පත් සහ සුරැකුම්පත් ස්වරූපයෙන් වූ වත්කම් වශයෙන් තබාගන්නා ලෙස ද මූල්‍ය සමාගම් වලට දන්වා සිටිනු ලැබීය. මෙම පියවරයන් 1984 සැප්තැම්බර් මස 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පනවනු ලැබුණි.

1984 පළමු මාස තුන තුළදී පෞද්ගලික අංශයට දෙන ලද ණය පසුගිය වර්ෂයේ අදාල මාසයන් හා සසඳනවිට සියයට 20 ඉක්ම වූ අනුපාතිකයකින් වැඩි විය. මෙම අංශයට දෙනු ලබන සීඝ්‍ර ණය ප්‍රසාරණය අඩු කිරීමේ අදහසින්, මහ බැංකුව විසින් දැනටමත් පැවති ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයන් ශක්තිමත් කරමින්, වරණාත්මක ණය පාලන ක්‍රම තව දුරටත් උපයෝගි කරගන්නා ලදී.

1984 මැයි 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, වාණිජ බැංකුවලට නැවත දැනුම් දෙන තුරු, අපනයන සහ කෘෂිකාර්මික කටයුතු සඳහා හැර, පෞද්ගලික අංශයට දෙනු ලැබූ සහ නොපියවා ඇති ණය සහ අත්තිකාරම් ප්‍රමාණය 1984 මැයි 11 වැනි දිනට දෙනු ලැබූ හා නො පියවා පැවති ණය සහ අත්තිකාරම් ප්‍රමාණයට වඩා සියයට 5 ක් නො ඉක්මවන ලෙස දැනුම් දුණි. ප්‍රමුඛතා අංශයන්ට ප්‍රමාණවත් ණය ගලා යාමක් සහතික කිරීමට සහ ප්‍රමුඛ නොවන අංශයන්ට ණය සීමා කිරීමටත් මෙම පියවර ගනු ලැබීය.

ආර්ථිකයේ උද්ධමනකාරී බලපෑම තීව්‍ර කරමින්, ද්‍රවශීලතාවයෙහි වූ තියුණු වැඩි වීම තවත් තිසි පියවරයන්හි අවශ්‍යතාව මතු කළේය. මේ අනුව, මූල්‍ය ප්‍රසාරණ අනුපාතිකය අධික වීමෙන් මිළ සම්බන්ධව අහිතකර බලපෑම් ඇතිවිය හැකිව තිබුනු නිසා අධි ද්‍රවශීලතාවය උරා ගැනීම සඳහා නිසි පියවර ගැනීම අවශ්‍ය විය. අධි ද්‍රවශීලතාවය ඇද ගැනීමේ ප්‍රධාන මාර්ගයක් ලෙස සහ ඉල්ලුම් පරිපාලන පාලන ප්‍රතිපත්තිවලට ආධාරක පියවරක් ලෙස, මහ බැංකුව මුදල් නීති පනතේ අංක 91(1) (ආ) වගන්තිය යටතේ ස්වකීය සුරැකුම්පත් නිකුත් කිරීමට තීරණය කළේය. වර්ෂය අවසානය දක්වා නිකුත් කළ සුරැකුම්පත් මගින් මහ බැංකුව වෙත රුපියල් 55 කෝටි 70 ලක්ෂයක් ලබාගත හැකි විය.

අධි ද්‍රවශීලතාවය තවදුරටත් ඇද ගැනීමට සහ වාණිජ බැංකුවල ණය මැවීමේ ධාරිතාව පාලනය කිරීම සඳහා, දැනටමත් පවත්වා ගෙන යනු ලබන ව්‍යවස්ථාපිත සංචිතවලට අමතරව, 1984 නොවැම්බර් 14 වැනි දින සිට ඔවුන්ගේ වැඩිවන තැන්පතු සඳහා විශේෂ සංචිත මහ බැංකුවේ තැබිය යුතු බවට බැංකුවලට උපදෙස් දෙන ලදී. මේ පිළිබඳ වැඩි විස්තර මෙම වාර්තාවේ II කොටසෙහි ''ගිණුම් හා බැංකු කටයුතු'' යටතේ දැක්වේ.

මෙකී ප්‍රතිපත්ති හේතුවෙන් බැංකු නොවන පෞද්ගලික අංශය සහ වාණිජ බැංකු යන දෙකොටසම වෙත වූ අධි ද්‍රවශීලතාවයෙන් සැළකිය යුතු කොටසක් අඩු කළ හැකි වූ අතර, එමගින් වාණිජ බැංකුවල ණය මැවීමේ ධාරිතාව ද අඩු කළ හැකි විය.

මහ බැංකුවේ පොලී අනුපාතික සම්බන්ධයෙන් සලකන විට, පෙර නැව් අපනයන ප්‍රතිමූල්‍ය ණය පහසුකම් සහ අතිරේක ප්‍රතිමූල්‍ය පහසුකම සඳහා, 1984 මාර්තු මාසයේදී හඳුන්වා දෙන ලද පොළී ප්‍රතිදාන ක්‍රමය සමග වූ වෙනස්කම් හැර, වෙනත් වෙනස්කම් නො විය. එයට අමතරව, මහ බැංකුව සහතික මිළ ක්‍රමය යටතේ වී අලෙවි මණ්ඩලයට දෙනු ලබන අලෙවි ප්‍රතිමූල්‍ය පහසුකම්වල පොළී අනුපාතිකය ප්‍රතිශත අංක 2 කින් වැඩි කරන්නට යෙදුණි.

1984 මුල් භාගයේ දී හඳුන්වා දෙන ලද මූල්‍ය සහ ණය ප්‍රතිපත්ති පියවරයන් වසර තුළ ණය පරිමාව සහ ණය ගලායන දිශාව කෙරෙහි බොහෝ දුරට බලපෑවේය. මාර්තු සහ මැයි යන මාසවලදී පනවනු ලැබූ ණය සීමාවන්හි අරමුණ වූයේ පෞද්ගලික අංශය සඳහා වන ණය

අනිසි ලෙස වැඩි වීම වලකාලීමය. කෙසේ වෙතත්, මෙකී සීමාවලින් මුදා හැරීම් සහ සහනි පොළී අනුපාතිකයන් යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම් වැඩි කිරීම මගින් අපනයන හා කෘෂිකර්ම අංශ සඳහා වූ වාණිජ බැංකු ණය තවදුරටත් දිරි ගන්වන ලදී.

මහ බැංකුව විසින් නොකඩවා සිව්වන වසරටද පිළියෙල කරන ලද ජාතික ණය සැළැස්ම, මහ බැංකුවේ මූල්‍ය සහ ණය ප්‍රතිපත්ති පිළිබඳව වූ පුළුල් රාමුව යටතේ පෞද්ගලික අංශය වෙත වූ වාණිජ බැංකු ණය අවැසි පරිදි යොමු කිරීමට ප්‍රයත්න දැරීය. මූල්‍ය සමස්තයන් කෙරෙහි, රජයේ අයවැය කටයුතුවල සහ විදේශීය අංශයෙහි බලපෑම සළකා බැලීමෙන් අනතුරුව, 1984 අගදී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට දෙනු ලැබූ නොපියවා පවතින මුළු අනුදත් ණය ප්‍රමාණය රුපියල් 3,653 කෝටි 70 ලක්ෂයක් ලෙස වසර මුලදී ඉලක්ක කොට ගනු ලැබීය. මේ අනුව, 1984 වසර තුළදී පෞද්ගලික අංශය සඳහා වන ණය රුපියල් 512 කෝටි 90 ලක්ෂය කින් නැතහොත් සියයට 16 කින් ඉහළ යනු ඇතැයි ඇස්තමේන්තු කෙරුණි. පසුගිය වසරේ දී මෙන්ම, ආංශික වශයෙන් ණය බෙදා හැරීමේදී කෘෂිකර්මය, කර්මාන්ත සහ අපනයන අංශයන් තවදුරටත් ප්‍රමුඛතා අංශ ලෙස පැවතුණි.

මහ බැංකුව විසින් 1984 මුලදී හඳුන්වා දුන් සීමාකාරී මූල්‍ය සහ ණය ප්‍රතිපත්ති පියවරයන් හේතුවෙන්, බැංකු ණයෙහි මූලික කාර්තුමය ඉලක්ක සම්බන්ධව සලකන කල පහත වැටීමක් ඇති විය. නිවාස කටයුතු හැරුණු විට අනිකුත් සෑම අංශයන් සම්බන්ධවම ණය ප්‍රයෝජනයට ගැනීම පිළිබඳව පහත වැටීම් වාර්තා විය. කෙසේ වෙතත්, 1984 තුළදී, කර්මාන්ත සහ අපනයන අංශයන් මගින් ඔවුනට වෙන් කළ මුළු ණය මුදල්වලින් සියයට 95 ක් පමණ ප්‍රයෝජනයට ගනු ලැබුණි. ණය සීමාවලින් නිදහස්ව පැවතියද, වසර මුළුල්ලේදීම කෘෂිකාර්මික ණය ඉලක්කයන්ගෙන් පහත් මට්ටමක පැවති බව සඳහන් කළ යුතුය. රුපියල් 54 කෝටි 50 ලක්ෂයක් නැතහොත් සියයට 13 ක් පමණ වූ විශාලතම පහත වැටීම වාර්තා වූයේ කෘෂිකාර්මික අංශයෙනි. කෘෂිකර්මයට අදාළ ණය දීමේ කටයුතු සම්බන්ධව වාණිජ බැංකුවල කාර්ය භාරය බොහෝ දුරට, මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය පහසුකම් යටතේ අරමුදල් ලබා ගත හැකි වන, අලෙවි කටයුතු ද ඇතුළත්ව කෙටි කාලීන කාරක ප්‍රාග්ධනය සැපයීමට සීමා විය. කෘෂිකාර්මික අංශයේ ලා ඉතාමත් අවශ්‍ය වන මැදි සහ දිගුකාලීන ආයෝජන ණය සැපයීමේ ලා වාණිජ බැංකු විසින් දරා ඇත්තේ සුළු ප්‍රයත්නයකි. කෘෂිකාර්මික ණය දීමේ ලා දක්නට ලැබෙන අසතුටුදායක ක්‍රියාකාරීත්වය ණය සැලසුම පිළිබඳ සමාලෝචන රැස්වීම්වලදී පෙන්වා දුන් අතර, ඉදිරි වර්ෂවලදී කෘෂිකාර්මික ණය සම්බන්ධව වඩාත් ක්‍රියාශීලී කාර්ය භාරයක් දරන ලෙස බැංකුවලින් ඉල්ලා සිටිනු ලැබීය.

1984 වර්ෂයේ අග භාගයේදී, දේශීය ණය ප්‍රසාරණයේ වාර්ෂික වර්ධනය පාලනය කිරීම සම්බන්ධයෙන් වසර තුළ ක්‍රියාත්මක වූ සීමාකාරී ණය ප්‍රතිපත්ති පියවරයන් සෑහෙන දුරට සමත් විය. 1983 වර්ෂයෙහි අවසානය වන විට, සියයට 16 ක්ව පැවති දේශීය ණය ප්‍රසාරණ වේගය 1984 වර්ෂය අවසානය වන විට ක්‍රමයෙන් සියයට 1 දක්වා අඩු විය. විශේෂයෙන්ම, පෞද්ගලික අංශයට දුන් ණයෙහි ප්‍රසාරණ වේගය සැළකිය යුතු ලෙස අඩු වීමට සහ බැංකු ක්‍රමයෙහි පැවති අධි ද්‍රවශීලතාවයෙන් කොටසක් ඇද ගැනීමට වර්ෂය තුළදී හඳුන්වා දෙන ලද ප්‍රතිපත්ති පියවරයන් විශාල වශයෙන් හේතු වුණි. 1983 වසර අවසානය වන විට සියයට 26 ක්ව පැවති පෞද්ගලික අංශයේ ණය වැඩිවීමේ වේගය, වරණාත්මක ණය පාලන ප්‍රතිපත්තින්හි ප්‍රතිඵලයක් වශයෙන් 1984 අවසානය වන විට සියයට 11 දක්වා අඩු විය.

1984 වර්ෂයේදී, මූල්‍ය සමස්තයන්හි සහ මිළ මට්ටම් වැඩිවීමේ වේගයෙහි සැළකිය යුතු මධ්‍යස්ථ බවක් පෙන්නුම් කරන ලදී. පටු මුදල් සම්බන්ධයෙන් මෙකී මධ්‍යස්ථතාවය වඩාත් කැපී පෙනුණි. මිළ අංශය සැළකිල්ලට ගත් විට, උද්ධමන අනුපාතයෙහි සැළකිය යුතු අඩු වීමක් දක්නට ලැබුණි. කොළඹ පාරිභෝගිකයන්ගේ මිළ දර්ශකයෙහි මධ්‍යස්ථ වැඩිවීමත් සමගම, තොග මිළ දර්ශකයේ වර්ධන වේගයේ සැළකිය යුතු පහත වැටීමක් සිදුවිය. විදේශීය

බත්කුම වැඩිවීම නිසා ඇතිවූ ප්‍රසාරණාත්මක බලපෑම සහ උද්ධමනකාරී පීඩනය වර්ෂය තුළදී ක්‍රියාත්මක කෙරුණ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාදාමයන් මගින් තරමක් දුරට සමනය කරනු ලැබීය. මේ අතර, රජයේ මුදල් ප්‍රතිපත්තීන් ද මූල්‍ය ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම කෙරේ නිශ්චිත වශයෙන්ම ආධාරකාරී විය. රජය බැංකු අංශයෙන් ගන්නා ලද ණය සැළකිය යුතු ලෙස අඩුවීම අනවශ්‍ය මූල්‍ය ප්‍රසාරණය සීමා කිරීමට ඉවහල් විය. එසේ වුවත්, මෙම සතුටුදායක වර්ධනයන් මූර්ත අංශයෙහිලා සම්පූර්ණයෙන්ම පිළිබිඹු නො වූයේ ප්‍රධාන වශයෙන් ව්‍යුහමය සහ ආයතනික අඩුපාඩුකම් නිසාය.